**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**තෙ වන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත) දෙවන සෙමෙස්තරය - 2019/2020**

# GYG 3267 - සමකාලීන සමාජ සහ පාරිසරික ගැටලු

**විවෘත ග්‍රන්ථ ලිඛිත විභාගය**

**විභාග අපේක්ෂකයින් සඳහා උපදෙස් මාලාව:**

- **ප්‍රශ්න පත්‍රය ආරම්භ වන්නේ පිටු අංක 2 සිටය.**
- සියලුම ලිඛිත ඇගයීම් <u>**අත් අකුරින් පමණක්**</u> ලිවිය යුතුය. ඔබේ අත් අකුරු පැහැදිලි ව ලිවීමට වග බලා ගන්න.
- ඔබේ පිළිතුරු A4 ප්‍රමාණයේ කඩදාසියක ලියන්න (සීආර් කොළ හෝ ෆුල්ස්කැප් කොළ මේ සඳහා භාවිත කළ හැකි ය). පිළිතුරු ලිවීමේ දී <u>**කළු බෝල් පොයින්ට් පෑනක්**</u> භාවිත කිරීම සුදුසු වේ.
- සාමාන්‍ය පරීක්ෂණයකදී මෙන් ඔබේ පිළිතුරු පරිගණකගත කිරීමට හෝ යතුරු ලියනය කිරීමට <u>**අවසර නොලැබේ.**</u> නමුත් දෘශ්‍යාබාධිත සිසුන් වැනි විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් අවසර ලබා දී ඇති සිසුන් සඳහා මෙම නියමය අදාළ නොවේ.
- කරුණාකර ඔබේ <u>**විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ සටහන් කරන්න**</u>. පිළිතුරු පත්‍රයේ කිසිදු ස්ථානයක ඔබේ නම සඳහන් කිරීමෙන් වළකින්න.
- පහත දැක්වෙන ආකෘතිය භාවිත කර පිළිතුරු පත්‍රයේ පහළ <u>**පිටු අංකනය කරන්න**</u>: උදා. එය පිටු 5 කින් සමන්විත නම් 1/5, 2/5… ආදී වශයෙන්.
- ඔබේ පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ලෙස පොදු මුල් පිටුව (එය LMS මගින් ලබාගත හැකි ය.) භාවිත කරන්න. <u>**අදාළ පොදු මුල් පිටුව මුද්‍රණය කිරීමෙන් හෝ අත් අකුරින් පිටපත් කිරීමෙන් හෝ ඔබට ලබා ගත හැකි වේ.**</u>
- පිළිතුරු පත්‍රයේ මුළු පිටු ගණන ඔබේ පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ සඳහන් කළ යුතු ය.
- පිළිතුරු පත්‍රයේ සියලු පිටු පිළිවෙලින් ඡායාරූපගත කර හෝ පරිලෝකනය (scan) කර එය <u>**තනි PDF ගොනුවකට**</u> පරිවර්තනය කරන්න. පරිලෝකනය කරන ලද රූපයේ සම්පූර්ණ පිටුවම නිසියාකාරව ආවරණය වී ඇති බවට වග බලා ගන්න.
- පිළිතුරු පත්‍රයේ පරිලෝකනය කළ රූපය පැහැදිලි / කියවිය හැකි බවට වග බලා ගන්න.
- <u>**LMS වෙත තනි පිටු වෙන වෙනම උඩුගත කිරීමට ඉඩ නොදෙන බව සලකන්න.**</u>
- <u>**පිළිගත හැකි එකම ගොනු ආකෘතිය PDF වේ. අපේක්ෂකයාගේ විභාග අංකය PDF ගොනුවේ නාමය ලෙස භාවිත කළ යුතු ය. උදා. A 12345**</u>
- ඔබගේ පිළිතුරු පත්‍රය J<u>**PEG / JPG හෝ වෙනත් ගොනු වර්ගයකින්**</u> උඩුගත කිරීමට ඔබට <u>**අවසර නොලැබේ.**</u>
- ඔබගේ ලිඛිත පරීක්‍ෂණවල <u>**අවසාන**</u> <u>**පිටපත පැය 24 ක් ඇතුළත LMSවෙත උඩුගත කිරීමට කටයුතු කරන්න**</u>.
- ඔබගේ පිළිතුරු පත්‍රය නිසි ආකාරයට යොමු කළ බව සනාථ කරගැනීම සඳහා <u>**'ඉදිරිපත් කරන ලදී (Submitted)'**</u> යන වචනය සමඟ LMSහි සම්පූර්ණ පිටුවේ <u>**තිර රුවක් (Screen shot) ගෙන සුරැකිව තබා ගන්නා ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ**</u>.
- LMS වෙත පිළිතුරු පත්‍රයක් උඩුගත කිරීමේදී යම් අනපේක්ෂිත තාක්ෂණික ගැටලුවක් ඇති වේ නම්, ඔබගේ පිළිතුරු පත්‍රයේ පිටපත විද්‍යුත් තැපෑලෙන් exam3@arts.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට <u>**දෙන ලද පැය 24 ඇතුළත**</u> යැවිය හැකි ය.

**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**තෙ වන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත) දෙවන සෙමෙස්තරය - 2019/2020**

# GYG 3267 - සමකාලීන සමාජ සහ පාරිසරික ගැටලු

**විවෘත ග්‍රන්ථ ලිඛිත විභාගය**

**පිළිතුරු ලිවීම සහ LMS වෙත උඩුගත කිරීම සඳහා කාලය පැය 24 කි.**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

1.

I. මිනිසා සහ පරිසරය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීමේ දී I = PAT දර්ශකයේ මූලිකාංග වල බලපෑම සාකච්ඡා කරන්න.

(වචන600:ලකුණු 10)

II. "සමාජ සහ පාරිසරික ගැටලු අවම කිරීම වෙනුවෙන් ක්‍රියාකිරීමේ දී, කාන්තාව කැපීපෙනෙන දායකත්වයක් ලබාදේ". නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(වචන600:ලකුණු 10)

(මුළු ලකුණු 20)

2.

I. ප්‍රජාවිද්‍යාත්මක සංක්‍රාන්ති මට්ටම් තුළදී ජන සංඛ්‍යාවේ වෙනස් වීම් සිදුවූ ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(වචන600:ලකුණු 10)

II. සංවර්ධනය වෙමින් පවත්නා රටවල හඳුනාගත හැකි ජන සංඛ්‍යාව ආශ්‍රිත ගැටලු යෝග්‍ය නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(වචන600:ලකුණු 10)

(මුළු ලකුණු 20)

3.

I. "නාගරික ධූරාවලිය නිර්ණය කිරීමේ දී එහි වෙසෙන ජන සංඛ්‍යාවේ ප්‍රමාණය සැමවිටම නිවැරදි නිර්ණායකයක් නොවේ". මෙම කියමන සාකච්ඡා කරන්න.

(වචන600:ලකුණු 10)

II. සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය ජනාවාස ආශ්‍රිතව හඳුනාගත හැකි සමාජ සහ පාරිසරික ගැටලු උදාහරණ සහිතව විමසන්න.

(වචන600:ලකුණු 10)

(මුළු ලකුණු 20)

4.

I. දරිද්‍රතා වර්ග (Types of Poverty) නම් කර ඒ එක් එක් වර්ගයෙහි හැසිරීම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(වචන600:ලකුණු 10)

II. ජනතාව දරිද්‍රතාවයට පත් කරනු ලබන සමාජ සහ පාරිසරික සාධක නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(වචන600:ලකුණු 10)
(මුළු ලකුණු 20)

5.

I. "වර්තමානයේ දී ගෝලීය වශයෙන් පවතින පාරිසරික ගැටුම් (Environmental conflicts) උත්සන්න වෙමින් පවතී". යෝග්‍ය නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(වචන600:ලකුණු 10)

II. "සරණාගතයින් සහ අභ්‍යන්තර අවතැන් වූවන් (IDPs) ඕනෑම රටක ආර්ථික, සමාජයීය, හා පාරිසරික ගැටලු ඇති කිරීමට හේතුවක් වේ". සුදුසු නිදසුන් ඇසුරින් විග්‍රහ කරන්න.

(වචන600:ලකුණු 10)
(මුළු ලකුණු 20)

6.

I. ඇතැම් සෞඛ්‍යමය ගැටලු තවදුරටත් වර්ධනය වීම කෙරෙහි පාරිසරික සාධක වල ඇති බලපෑම නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(වචන600:ලකුණු 10)

II. වායු දූෂණය හේතුවෙන් ඇති වී තිබෙන පාරිසරික ගැටලු අවම කිරීම සඳහා යොදාගෙන ඇති නවීන තාක්ෂණික ක්‍රමවේදයන්හි වැදගත් කම නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(වචන600:ලකුණු 10)
(මුළු ලකුණු 20)

*******************